**ජාතික ළමා ආරක්ෂක අධිකාරිය - 2020**

**----------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**-------------------------------**

ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය. හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශ ගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**----------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිතියටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරනපාර්ශවයන්ගේ වගකීම්**

**------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙසමා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟ හැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිත භාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

---

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

---

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම් කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාලවකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබා ගැනීමට ප්‍රමාණවත් "මනා ලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 හි 76 (ඇ) ඡේදය ප්‍රකාරව කල් පිරීමේ කාලය මාස 06 ක් වූ වටිනාකම රු.4,579,895 ක ස්ථාවර තැන්පතුවක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ ජංගම නොවන වත්කම් යටතේ දක්වා තිබුණි. | ස්ථාවර තැම්පතුව ආරම්භ කිරීමේ අරමුණ දිගුකාලීනව පවත්වාගෙන යමින් වැඩි පොලී අනුපාතයක් ලබා ගැනීම බැවින් ජංගම නොවන වත්කම් යටතේ දක්වා ඇත. | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීවිත කාලය සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු. 34,164,697 ක් වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන්ම ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | ප්‍රත්‍යාගණනය කිරීම සඳහා 2021 වර්ෂයේ දී කමිටුවක් පත් කිරීමට කටයුතු කර කඩිනමින් ප්‍රත්‍යාගණනය කර අවසන් කිරීමට නියමිතයි. | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල විය යුතුයි. |

**1.5.3 ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකාරිය ඉදිරිපිට පැවති පැරණි මායිම් තාප්පය වෙනුවට නව මායිම් තාප්පය ඉදිකිරීම සඳහා සමාලෝචිත වර්ෂය දක්වා වැය කර තිබුණු එකතුව රු. 5,754,823 ක් ප්‍රාග්ධනිත කිරීම වෙනුවට අයහාර වියදම් ලෙස ගිණුම්ගත කර තිබූ අතර පැරණි මායිම් තාප්පයේ වටිනාකම හඳුනාගෙන පොත්වලින් ඉවත් කිරීමට ද කටයුතු කර නොතිබුණි. | වාර්ෂික ප්‍රත්‍යාගණන අවශ්‍යතා අනුව සලකා බලා ඉදිරි කටයුතු සිදු කරන ලෙස උපදෙස් ලබා දී ඇත. | නිවැරදිව ගිණුම් තැබිය යුතුය. |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු මුදල්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දීර්ඝ කාලයක් තිස්සේ නිරවුල් නොවූ එකතුව රු.962,623 ක් වූ ගිණුම් 3 ක ශේෂ ජංගම වත්කම් යටතේ දක්වා තිබුණි. | මෙම නිරවුල් නොකල ගිණුම් ශේෂ 03, 2021 වර්ෂයේ දී පරීක්ෂා කර බලා අවශ්‍ය නිවැරදි කිරීම් සිදු කිරීමට ක්‍රියාමාර්ග ගනිමින් ඇත. | කඩිනමින් නිරවුල් කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | ජංගම නොවන වත්කම් යටතේ ව්‍යාපෘති ඌනතාවයක් ලෙස එකතුව රු.602,509 ක් වර්ෂ 10 කට වඩා වැඩි කාලයක සිට නිරවුල් කිරීමකින් තොරව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණි. | මේ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගනිමින් ඇත. | නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ජංගම නොවන වත්කම් යටතේ ව්‍යාපෘති අතිරික්තයක් ලෙස එකතුව රු.3,358,669 ක් වර්ෂ 10 කට වඩා වැඩි කාලයක සිට නිරවුල් කිරීමකින් තොරව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණි. | මේ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගනිමින් ඇත. | නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) 2015 ජූලි 14 දිනැති අංක 3/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 371(2)(ආ), 371(5) | (i)එක් අවස්ථාවකදී රු 100,000. ක උපරිමයක් දක්වා තත්කාර්යය අතුරු අග්‍රිමයක් ලබා දිය යුතු වුවද, අවස්ථා 04 ක දී එකී සීමාව ඉක්මවා අත්තිකාරම් ලබා දී තිබුණි. | දිස්ත්‍රික් හා ප්‍රාදේශීය නිලධාරීන්ට අත්තිකාරම් ලබා දීමේදී දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත මෙම මුදල් ප්‍රතිපාදන යොමු කර ඇත. | චක්‍රලේඛයට අනුකූලව කටයුතු කළ යුතුය. |
| | (ii) අග්‍රිමය නිකුත් කරන ලද මුදල් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වැඩියෙන් ප්‍රමාද නොකර පියවිය යුතු වුවද, 2019 වර්ෂයේ දී අවස්ථා 31 කදී නිකුත් කළ රු.223,580 ක අත්තිකාරම් ද, සමාලෝචිත වර්ෂය තුළ දී නිකුත් කල අත්තිකාරම්වලින් රු.1,231,014 ක් ද 2020 දෙසැම්බර් 31 දින වන විටත් පියවීමට කටයුතු කර නොතිබුණි. | දිස්ත්‍රික් හා ප්‍රාදේශීය නිලධාරීන්ගේ අත්තිකාරම් පියවීමේ වවුචර් පත් තැපැල් මඟින් ප්‍රධාන කාර්යාලය වෙත යොමු කරන බැවින් එහිදී සිදුවන ප්‍රමාදයන් හේතුවෙන් අත්තිකාරම් පියවීමට නොහැකි වී ඇත. | චක්‍රලේඛයට අනුකූලව කටයුතු කළ යුතුය. |
| | (iii) අදාළ කාර්යය අවසන් කර දින 10 ක් ඇතුළත පියවීමට කටයුතු කළ යුතු වුවද සමාලෝචිත වර්ෂය තුළ දී අවස්ථා 39 ක දී දිස්ත්‍රික් ලේකම්වරුන් සහ ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත ලබා දී තිබූ එකතුව රු.1,428,800 ක | රටේ පැවති කොවිඩ් වසංගත තත්ත්වය මත පැවති නිරෝධායන නීති රෙගුලාසි හේතුවෙන් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට හැකියාවක් | චක්‍රලේඛයට අනුකූලව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අත්තිකාරම් අදාළ කාර්යය වෙනුවෙන් යොදවා ගැනීමකින් තොරව දින 18 සිට දින 119 ක් දක්වා අත රඳවා ගැනීමෙන් පසු පියවා තිබුණි. | නොලැබීම මත නැවත පියවා තිබුණි. | |
| (ආ) 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | සෑම මුදල් වර්ෂයකම ජූනි 15 දිනට පෙර පසුගිය වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවද 2019 වර්ෂයට අදාළ වාර්තාව 2021 පෙබරවාරි 08 ඉදිරිපත් කර තිබූ අතර, 2020 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය 2021 මැයි වන විටත් නිම කර නොතිබුණි. | 2020 වර්ෂය පුරාවටම කොවිඩ් වසංගතය හේතුවෙන් වරින්වර රට වසා දැමීම සිදු වූ අතර, එබැවින් භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් කිරීමට ප්‍රමාද විය. | චක්‍රලේඛයට අනුකූලව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.2,968,095 ක ඌනතාවයක් වූ අතර, ඊට ප්‍රතිරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.2,900,087 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.5,868,182 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට භාණ්ඩාගාරයෙන් ලබා දෙන ප්‍රදාන අඩු වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකාරියේ 1929 දුරකතන අංකයට ලැබෙන පැමිණිලි සම්බන්ධයෙන් ක්‍රියාත්මක වීම සඳහා සුදුසු යාන්ත්‍රණයක් සකස් කිරීම සහ අදාළ ක්‍රමවේදය වැඩිදියුණු කිරීමට නිර්දේශ ලබාගැනීම වෙනුවෙන් උපදේශිකාවක් වෙත 2016/2017 වර්ෂවලදී රු.900,000 ක් ද, පරිගණක පද්ධතියක් සකස් කිරීම සඳහා රජයේ ආයතනයකට රු.1,200,000 ක් ද ගෙවා තිබුණි. උපදේශිකාවගේ වාර්තාව ලබා දී වර්ෂ 3 ක කාලයක් ගත වී තිබුණ ද, එහි ඇතුළත් නිර්දේශ හා ක්‍රමවේද අනුගමනය කිරීම කෙරෙහි කළමනාකරණයෙහි අවධානය යොමු වී නොතිබූ අතර, දත්ත පද්ධතියද ක්‍රියාත්මක කර නොතිබුණි. | 1929 මෘදුකාංගය සමඟ මෙම දත්ත පද්ධතිය නොගැලපේ. | උපදේශක වාර්තාව මඟින් ලබා දී ඇති නිර්දේශ ක්‍රියාත්මක කර දත්ත පද්ධති ක්‍රියාත්මක කිරීම කෙරෙහි කඩිනමින් අවධානය යොමු කළ යුතුය. |

### 3.2 අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ළමා අපචාර වැළැක්වීමේ කාර්යය සඳහා සහ එවැනි අපචාරවලට ගොදුරු වූවන් ආරක්ෂා කිරීම, ඔවුන්ගේ අයිතීන් රැක ගැනීම සහ ගතයුතු සියළු ක්‍රියාමාර්ග ගැනීම වෙනුවෙන් 2010 වර්ෂයේ දී ජාතික ළමා ආරක්ෂක අරමුදල පිහිටුවන ලද අතර, 2021 මාර්තු 29 වන විගණිත දින වන විට මෙම අරමුදලෙහි රු.2,378,477 ක ශේෂයක් පැවතියද 2018 වර්ෂයේ සිට අරමුදලෙහි අරමුණු ඉටුකර ගැනීම වෙනුවෙන් කිසිදු මුදලක් වැය කර නොතිබුණි. | මෙම අරමුදලෙහි ශේෂය පරීක්ෂා කර බලා නියමිත පරිදි වියදම් කළයුතු බැවින් පරීක්ෂා කිරීම් සිදුකර ප්‍රතිපාදන නිකුත් කිරීමට නියමිතව ඇත. | පනතේ අරමුණුවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

### 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2016 වර්ෂයේ රු.18,317,757 ක වටිනාකමකට කල්බදු පදනම යටතේ ලබා ගත් ඉඩම 2021 අගෝස්තු 31 දින වන විටත් නිශ්කාර්යව පැවතුණි. | භාණ්ඩාගාර ප්‍රතිපාදන සැලසුම් කර ඉල්ලීම් කල ද, මූල්‍ය ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් ඉදිකිරීම් කටයුතු සිදු කිරීමට නොහැකි වී ඇත. | සම්පත් උපරිම කාර්යක්ෂමතාවයෙන් යුතුව භාවිතා කල යුතුය. |

### 3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) කොවිඩ් 19 වසංගත තත්ත්වය තුළ ළමයාට සිදුවන කායික හා මානසික බලපෑම සහ සමාජ වගකීම විදහා දැක්වෙන ආකාරය පාදක කර ගනිමින් ඒකාංගික ටෙලි නාට්‍යයක් නිෂ්පාදනය කිරීම සඳහා හදිසි ප්‍රසම්පාදන ක්‍රමය අනුගමනය කරමින් රු.250,000 ක් වැය කර තිබුණ ද, විගණිත දිනය වන 2021 මාර්තු 30 දින විටත් මෙම නාට්‍ය විකාශනය කිරීමට කටයුතු කර නොතිබුණි. | සංවර්ධන ක්‍රියාකාරකම් යටතේ පවතින ප්‍රතිපාදන මත මෙම කාර්යය සිදු කරන ලදී. 2021 වසරේ ප්‍රතිපාදන ලද වහාම මෙම නාට්‍ය විකාශනය කිරීමට මෙන්ම ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නිල වෙබ් අඩවිය මඟින් ද, යූ ටියුබ් චැනලය මඟින් ද දැනුවත් කිරීමේ මෙවලමක් ලෙස මෙය ප්‍රචාරණය කිරීමට සැලසුම් කර ඇත. | හදිසි අවශ්‍යතාවය මත සිදු කරන කාර්යයන් කාර්යක්ෂම ලෙස හා ඵලදායී ලෙස එම කාලය තුළ අදාල නීති රීතිවලට අනුකූලව නොපමාව ඉටු කල යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) අධිකාරිය විසින් 2019 වර්ෂය තුළ දී තේමාවන් 03 ක් ඔස්සේ අත්පොත් 8,500 ක් මුද්‍රණය කිරීම සඳහා රු.4,056,501 ක් වැය කර තිබුණද ඉන් පිරිවැය රු.3,245,200ක් වූ පොත් 6,800 ක් විගණිත දිනය වන 2021 මාර්තු 08 දින වන විටත් බෙදා හැරීමකින් තොරව ගබඩා කර තිබුණි. | 2021 වර්ෂයේ දී එම අත්පොත් බෙදා හැරීම මේ වන විට ආරම්භ කර ඇති අතර, ඒ අනුව 2021 වර්ෂයේ එම මුද්‍රණ සියල්ල බෙදා අවසන් කිරීමට සැලසුම් කර ඇත. | අවශ්‍යතාවය හඳුනා ගෙන සම්පත් කාර්යක්ෂම හා ඵලදායී ලෙස උපයෝජනය කල යුතුය. |

**3.5 වෙනත් සංවිධානවලට මුදාහළ සම්පත්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකාරියේ සහාකාර අධ්‍යක්ෂ (වැඩසටහන්) තනතුරු දැරූ නිලධාරිනිය වසර 10 කට වැඩි කාලයක සිට වැටුප් හා දීමනා ප්‍රතිපූරණය කිරීමේ පදනම මත අමාත්‍ය කාර්ය මණ්ඩලයේ සේවය සඳහා මුදා හැර තිබූ අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම තනතුර සඳහා වෙනත් නිලධාරියෙකුගේ සේවය ලබාගෙන නොතිබුණි. | සුදුසු පියවර ගැනීමට නියමිතව ඇත. | අනුමත කාර්ය මණ්ඩලය තුල සිටින නිලධාරීන් දීර්ඝ කාලීනව වෙනත් ආයතනවලට මුදා හැරීමේ දී අධිකාරියේ කාර්යසාධනයට ඇතිවන බලපෑම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමු කළ යුතුය. |

**3.6 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට අධිකාරියේ අනුමත කාර්ය මණ්ඩලය 548 ක් වූ අතර, තත්‍ය කාර්ය මණ්ඩලය 344 වූයෙන් තනතුරු 204 ක පුරප්පාඩු පැවතුණි. | බඳවා ගැනීම් සඳහා ඉදිරි කටයුතු මේ වන විට ආරම්භ කර ඇත. | අධිකාරියේ අරමුණු ඉටු කර ගැනීම සඳහා මානව සම්පත් කළමනාකරණය විධිමත් පරිදි සිදුවිය යුතුය. |
| (ආ) නිලධාරින් බඳවා ගැනීම සඳහා සහ සේවයේ නියුක්ත නිලධාරීන් ඒ ඒ තනතුරුවල රඳවා ගැනීම සඳහා කලයුතු බඳවා ගැනීමේ පටිපාටිය සංශෝධනය කිරීම, වැටුප් තලයන් සංශෝධනය කිරීම, සේවා ස්ථිර කිරීම වැනි කාර්යයන් දීර්ඝ කාලයක සිට සිදු කර නොමැති වීම හේතුවෙන් අධිකාරියේ සේවක පිරිවැටුම ඉහල මට්ටමක පැවති බව විගණනයේ දී නිරීක්ෂණය විය. එය අධිකාරියේ අරමුණු ඉටුකර ගැනීමේ ප්‍රමාදයට බලපා තිබුණි. | ස්ථිර කිරීමට අදාල කටයුතු අවසන් කරමින් පවතින බව හා වැටුප් තල සම්බන්ධ පැවති ගැටලු විසඳීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සමඟ අවශ්‍ය සම්බන්ධීකරණය සිදු කොට ඇත. | අධිකාරියේ අරමුණු ඉටු කර ගැනීම සඳහා මානව සම්පත් කළමනාකරණය විධිමත් පරිදි සිදුවිය යුතුය |

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

## 4.1 වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජුනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 ඡේදය ප්‍රකාරව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, 2016 වර්ෂයේ සිට අදාළ වාර්ෂික වාර්තා 2021 මාර්තු 19 වන විගණිත දින වන විටත් සභාගත කර නොතිබුණි. | 2016, 2017 අමාත්‍ය මණ්ඩලය වෙතත්, 2018 මුද්‍රණයට යොමු කර ඇති අතර 2019 භාෂා පරිවර්තනය කර ඇත. 2020 අවසන් කෙටුම්පත අවසන් කර ඇති බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 4.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුළ ඇතුලත් ක්‍රියාකාරකම් 15 ක් වෙනුවෙන් පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් 420 ක් සඳහා රු.8,140,000 ක් ප්‍රතිපාදනය කර තිබුණ ද, ඉන් රු.845,000 ක් පමණක් වැය කර වැඩසටහන් 12 ක් පමණක් පවත්වා තිබුණි. | කොවිඩ් තත්ත්වය නිසා 19 වැඩසටහන් පැවැත්වීමට නොහැකි වූ බව | ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව කටයුතු කළ යුතුය |
| (ආ) අධිකාරිය පිහිටුවා වසර 20 ක් ගත වූ පසුව 2019 ඔක්තෝබර් 29 දින අනුමැතිය ලැබී ඇති ජාතික ළමා ආරක්ෂක ජාතික ප්‍රතිපත්තිය 2021 මාර්තු 29 විගණිත දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබීම හේතුවෙන් ජාතික ප්‍රතිපත්තිය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නීතිමය, පරිපාලනමය හෝ වෙනත් සංශෝධන නිර්දේශ කිරීමේ කාර්යයන් ඇතුළු ඊට අනුශාංගික කාර්යයන් ද ඉටු වී නොතිබුණි. | ළමා ආරක්ෂණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය 5 අවුරුදු ක්‍රියාකාරී සැලැස්ම 2021-2025 නිම කිරීමට අපේක්ෂිතය. විෂය ක්ෂේත්‍ර 10 ක් ආවරණය වන සේ අදාළ ආයතන සම්බන්ධීකරණය කිරීම පහසු කාර්යයක් නොවන බව හා ළමා ආරක්ෂක කමිටු ආරම්භ කිරීමට අවශ්‍ය මූලික කටයුතු සිදු කරමින් ඇත. | ළමා ආරක්ෂක ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට කඩිනම් පියවර ගත යුතුය. |
| (ඇ) 2011 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා අධිකාරිය වෙත වාර්තා වී ඇති පැමිණිලි සංඛ්‍යාව 89,405 කින් නොවිසඳී ඉදිරියට ගෙනවිත් තිබූ පැමිණිලි සංඛ්‍යාව 40,668 ක් වූ අතර, මෙම පැමිණිලි කඩිනමින් | 2021 වර්ෂයේ සිට පැමිණිලි කඩිනමින් විසඳීම සඳහා වැඩපිළිවෙලක් සකස් කර ඇත. | වර්ෂයේ සිට 2011 පවතින නොවිසඳී ඇති පැමිණිලි කඩිනමින් විසඳීමට පියවර ගත යුතුය. |

| | | |
|---|---|---|
| විසඳීම සඳහා වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි. | | |
| (ඇ) අධිකාරිය පිහිටුවා වසර 21 ක් ගත වී ඇතත් පනත ප්‍රකාරව ජාතික දත්ත පදනමක් සකස් කර නොතිබුණි. | 2021 වර්ෂය අවසානයේදී දත්ත පද්ධතියක් සකස් කිරීමට කටයුතු කර ඇත. | ජාතික දත්ත පද්ධතිය කඩිනමින් සකස් කල යුතුය. |

**4.3 අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2009 ජුනි 09 දිනැති කළමනාකරණ විගණන චක්‍රලේඛ අංක ඩීඑම්ජ්/2009/(1) හි 3 ඡේදයට අනුව අදාල කාර්යයන් ඉටු කිරීම සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් අභ්‍යන්තර විගණන අංශයට අනුයුක්ත කර නොතිබුණි. | අධිකාරියේ පවතින පුරප්පාඩු හේතුවෙන් අභ්‍යන්තර විගණන අංශය සඳහා නිලධාරියෙකු අනුයුක්ත කිරීම අපහසු වී ඇති බව | ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් අනුයුක්ත කර අභ්‍යන්තර විගණනය ශක්තිමත් කළ යුතුය. |